01) පාඩම හෝ ඒකකය - සංගීත ශිල්පීන් (පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා මහතා)

02) ඉගෙනුම් ඵල -

- පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා මහතාගේ ජීවන තොරතුරු අධ්‍යයනය කරයි.
- පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා සංගිතය ක්ෂේත්‍රයට ලබාදුන් සුවිශේෂි මෙහෙය අගය කරයි .
- පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා දක්ෂතා පෙන් වූ සංගීත භාණ්ඩය නම් කරයි.
- පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා මහතා දිනා ගත් සම්මාන 03 ක් හා උපාධියනම් කරයි.
- පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා දක්ෂතා පෙන් වූ විවිධ ක්ෂේත්‍ර අධ්‍යයනය කරයි.

03) ශිෂ්‍යා කළ යුතු කාර්යයන් -

- E නැණ පියස සාමාන්‍ය පාඩම් සහ අන්තර්ජාලය උපයෝගී කරගෙන පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා මහතා පිළිබඳ තොරතුරු ගවේශනය කරන්න.
- අන්තර්ජාලය ඔස්සේ එතුමාගේ නිර්මාණය නරඹා රස විඳින්න.


1) පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා මහතාගේ ජීවන තොරතුරු අධ්‍යයනය කරයි.

2) පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා සංගිතය ක්ෂේත්‍රයට ලබාදුන් සුවිශේෂි මෙහෙය අගය කරයි.

3) පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා දක්ෂතා පෙන් වූ සංගීත භාණ්ඩය නම් කරයි.

4)පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා මහතා දිනා ගත් සම්මාන 03 ක් හා උපාධියනම් කරයි.

5) පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා දක්ෂතා පෙන් වූ විවිධ ක්ෂේත්‍ර අධ්‍යයනය කරයි




පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක -

හරිප්‍රසාද් චෞරාසියා 1938 ජූලි 01 වන දින ඉන්දියාවේ උත්තර් ප්‍රදේශයේ අලහබාද් නගරයේ දී උපත ලැබී ය. මොහුට අවු. 06ක් වන විට ඔහුගේ මව මිය ගියා ය.

ඔහුගේ පියා මල්ලව පොර ක්‍රීඩකයෙකි. පියාට අවශ්‍ය වූයේ ඔහු ද මල්ලව පොර ක්‍රීඩකයකු කිරීමට ය. ඔහු පියා සමග වසර කිහිපයක් මල්ලව පොර ක්‍රීඩාව පුහුණු විය. චෞරාසියා වසර 15 දී පමණ අසල්වැසියකු වූ පණ්ඩිත් රාජාරාම් ගෙන් ගායනය හැදෑරීම ආරම්භ කළේ ය. පසු ව පණ්ඩිත් බෝලනාත් ප්‍රසන්නගෙන් වසර 8ක පමණ කාලයක් බටනළා වාදනය පුහුණු කළේ ය. හරිප්‍රසාද් චෞරාසියා ප්‍රචලිත ව ඇත්තේ බන්සූරි වාදකයකු ලෙස ය.

මල්ලව පොර ක්‍රීඩාවේ අභ්‍යාසවල යෙදීමෙන් ලත් පුහුණුව නිසා ඔහුගේ පෙණහලු ශක්තිය වර්ධනය විය. එය ඔහුට බටනලා වාදනයට උපකාර විය. ඔහු වරෙක මෙසේ පවසා ඇත. 'මම මල්ලව පොර ක්‍රීඩාවට දක්ෂයෙක් නොවේ. ඒත් මට පියා සනසන්නට සිදු වුණා. එමගින් ලැබුණු ශක්තිය අද මට බටනළා වාදනයට උදවු වෙනවා'.

චෞරාසියා 1957 දී ක්‍රියාකාරී ව ක්ෂේත්‍රයට අවතීර්ණ විය. ඔහු ඉන්දියානු ගුවන් විදුලියට සම්බන්ධ වූ අතර සංගීත නිර්මාණකරුවකු හා වෘත්තීය වාදකයකු ලෙස ද කටයුතු කළේ ය. මොහු සංගීත අධ්‍යක්ෂවරයකු ලෙස ශිවකුමාර් ශර්මා සමග කටයුතු කර ඇත. ඔවුන්ගේ සංගීත කණ්ඩායම ශිවහරි (SHIV - HARI) නමින් හැඳින්විණි. එමෙන් ම ඔහු බටහිර සංගීතඥයන් සමග සහයෝගයෙන් කටයුතු කරන අතර ඉන්දියානු චිත්‍රපට මෙන් ම තෙලිගු හා ඉංග්‍රීසි චිත්‍රපට සඳහා ද සංගීත නිර්මාණයෙන් දායක වී ඇත. ඔහු නෙදර්ලන්තයේ රොටර්ඩෑම්වල පිහිටි ලෝක සංගීත සංරක්ෂක දෙපාර්තමේන්තුවේ කලා අධ්‍යක්ෂවරයකු ලෙස මේ අනුව කටයුතු කරයි. 2006 වසරේ මුම්බායි නගරයේ දී ආරම්භ කළ වින්දාවන් ගුරුකුලයේ සහ 2010 වසරේ දී භුබනේෂ්වර් (Bhubaneshwer) නගරයේ දී ආරම්භ කළ වින්දාවන් ගුරුකුලයේ ආදි කර්තෘවරයා ද මොහු ය. මෙම අධ්‍යයන ආයතන දෙක ම හින්දුස්ථානී සංගීතය සහ බන්සූරි වාදනය පුහුණු කිරීම සඳහා කැපවූ ආයතන වේ.
ගුරුවරයකු ලෙස ඔහු රාකේෂ් චෞරසියා, රූපක් කුල්කර්නි, විවේක් සෝනාර්, සමීර් රාඕ, ජය ගාන්ධි, සන්තෝෂ් සාන්ත් සහ හිමාංශු නන්දා වැනි ප්‍රසිද්ධ ශිෂ්‍ය පරම්පරාවක් බිහි කර ඇත. සංගීත ක්ෂේත්‍රය තුළ කරන ලද නිර්මාණ වෙනුවෙන් ඔහු සම්මාන රැසකින් පිදුම් ලැබී ය.

- Sangeet Natak Academy - 1984
- Konark Samman - 1992
- Padma Bhushan - 1992
- Yash Bharati Samman - 1994
- Padma Vibhushan - 2000

ඒ අතරින් කිහිපයකි. මීට අමතර ව ඔහු රටවල්

51

කිහිපයකින් ම ගෞරව සම්මාන ලබා ඇත. ඉන්දීය සංගීත ක්ෂේත්‍රයට හා ලෝක සංගීතයට ඔහු සිදු කළ සේවය වෙනුවෙන් උතුරු ඔරිස්සා විශ්ව විද්‍යාලයෙන් 2009 වසරේ දී ඔහුට ආචාර්ය උපාධියක් ද පිරිනමනු ලැබී ය. 'Woodwinds of Change' නමින් ඔහුගේ නිල චරිතාපදානය 2008 වසරේ දී Surjit Singh විසින් රචනා කර ඇති අතර 'Hariprasad Chaurasia and the Art of Improvisation' නම් කෘතිය Henri Tournier විසින් රචනා කරනු ලැබ ඇත.

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - 10 ශ්‍රේණිය පෙරදිග සංගීතය - https://www.enenapiyasa.lk
- ගුරු ගෙදර - නැත
- වෙනත් - (YouTube) - https://www.youtube.com/watch?v=bKAr3dKVpsQ
  https://www.youtube.com/watch?v=MVodVGkbi_Y

05) අතිරේක පොත්/සගරා -

- 10 ශ්‍රේණිය පෙරදිග සංගීතය අතිරේක කියවීම් පොත, සෞන්දර්ය අධ්‍යාපන දෙපාතර්මේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.